# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/23 - 2019 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2019.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

(2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥා පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන වන මම, 2018 අප්‍රේල් මස 27 වන දිනැති අංක 2068/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් සංශෝධිත 2017 නොවැම්බර් මස 02 වන දිනැති අංක 2043/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඇල්පිටිය ප්‍රාදේශීය සභාවට අදාළ නියමය එහි (4) වන ඡේදයට පසුව පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරමි.

"(5) මෙම ප්‍රාදේශීය සභාවේ සභිකයන්ගේ ධුර කාලය 2019 නොවැම්බර් මස 05 වන දින සිට ආරම්භ විය යුතුය."

වජිර අබේවර්ධන,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

12 - 351


1A - G 031569 - 17 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.